# සිව් මිතුරියෝ



හිරණ්‍යා සත්සරණී දිසානායක

# සිව් මිතුරියෝ

හිරණ්‍යා සත්සරණී දිසානායක

## කතෘගේ වෙනත් කෘති

* අපූරු යාළුවෝ සහ තවත් කතා

* මගේ පුංචි නංගියා

ISBN NO
978 624 208 079 6

# පිදුම

ආදරයෙන් මට ශිල්ප ලබා
දෙන මහාමායා විදු
මෑණියන්ට පුදමි මේ ග්‍රන්ථය

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිපිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජිවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

# පටුන


| | | |
|---|---|---|
| 1. | ව්‍යාපෘතිය | 6-10 |
| 2. | ගහ උඩ ගෙදර | 11-18 |
| 3. | තරඟ ප්‍රතිඵල | 19-21 |
| 4. | අමුත්තන් තිදෙනෙක් | 22-28 |
| 5. | අභියෝගාත්මක දවසක් | 29-32 |
| 6. | කරදරයක් | 33-37 |
| 7. | හාස්‍යජනක සිද්ධියක් | 38-40 |
| 8. | හොඳ උපායක් | 41-42 |
| 9. | උපක්‍රමය සාර්ථකයි | 43-45 |
| 10. | ජයග්‍රහණයක් | 46-47 |

# ව්‍යාපෘතිය

සිකුරාදා දිනය එළඹිණි.
"සුභ උදෑසනක් ජෙසී, අද පන්ති භාර මැඩම් අපිට ව්‍යාපෘතියක් කරන්න දෙනවා කිව්වා නේද ?. මම නම් හරිම නොඉවසිල්ලෙන් ඉන්නේ. අපිට මොන වගේ මාතෘකාවක් ලැබෙයිද දන්නේ නැහැ."පාසල් ඒමට නිවසින් පිටත් වූ රෝසි පාරේ ගමන් කරමින් සිටි ජෙසී අමතා කීවාය.
"ඔව් මටත් ඒක දැන ගන්නකන් ඉවසිල්ලක් නැහැ. අපි ටිකක් ඉක්මනට ඉස්කෝලෙට යමු. දැන් 7:30 වෙන්නත් ලඟයි. බිලැක් සහ වයිට් දෙන්න නම් මේ වෙනකොට ඉස්කෝලෙට ගිහිල්ලත් ඇති." ජෙසී එසේ කීවේ රෝසිගේ අත් අල්ලා ගෙන දුවන්නට සැරසෙමින් ය.
දෙදෙනාම ඉක්මනින් දිවගොස් පාසලට ගියහ

"සුභ උදෑසනක් අපි ඔයාලා එනකන් බලාගෙන හිටියේ" බිලැක් සහ වයිට් එකවරම කීවේ සිනාසෙමිනි.
"සමාවෙන්න අපි ටිකක් පරක්කු වුණා" ජෙසී සහ රෝසි එසේ කීවේ හති දමමිනි.

"අපි හිතුවේ ඔයාලා අද පන්ති භාර මැඩම් දෙන ව්‍යාපෘතිය මගහරින්න ගෙදරට වෙලා ඉඳීවි" කියලා. එසේ කීවේ වයිට් ය.

"අන්න, පන්ති භාර ගුරුතුමිය පංතියට ගියා. අපිත් ඉක්මනට යමු. බිලැක් එසේ කියද්දී මිතුරියන් හතර දෙනාම පන්තිය වෙත දිව ගියහ.

"ආයුබෝවන් ළමයි සුභ උදෑසනක්, මම අද ඔයාලගේ ව්‍යාපෘතිවලට මාතෘකා දෙනවා හැමෝම කණ්ඩායම් වලට බෙදිලා ද ඉන්නේ"පන්තිබාර ගුරුතුමිය වූ ක්ලෝරා මහත්මිය ඇසුවාය.

"ඔව් මැඩම්"ළමයි එකවර කෑගැසුවේ පන්තියේ බිත්ති දෙදරා යන තරම් ශබ්දයෙකිනි. ඒ ඔවුන්ගේ ප්‍රීතිය නිසයි. ඔවුන්ගේ මේ ප්‍රීතියට හේතුව ඔවුන්ගේ 10 ශ්‍රේණියේ පළමු ව්‍යායාපෘතිය මෙය වන බැවිනි.

"හරි එහෙනම් ඔයාලා කණ්ඩායම් කීයකට බෙදුන ද? මම කණ්ඩායම් ගණනට අනුව ව්‍යාපෘතියවල මාතෘකා දෙන්නම්." ගුරුතුමිය කීවාය.

"මැඩම් අපි කණ්ඩායම් 5 කට බෙදුනා. එක කණ්ඩායමකට සාමාජිකයො හතර දෙනෙක් ඉන්න විදිහට"පන්තියේ පන්ති නායිකාව වූ ලිලී කීවාය.

"හා හොඳයි, මම එහෙනම් මාතෘකා 5ක් දෙන්නම්. හැබැයි මම මේ සැරේ දෙන්නෙ ටිකක් අමාරු මාතෘකා, මොකද ඔයාලා 10 ශ්‍රේණිය ඉගෙන ගන්න ළමයි නිසා. ඒ වගේම ටිකක් හොඳට හිතලා බලලා වැඩ කරන්න පුළුවන් ළමයි නිසා" ක්ලෝරා ගුරුතුමිය කීවාය.

"පලවෙනි කණ්ඩායම කවුද?"ගුරුතුමිය යළිත් ඇසුවාය.

"මැඩම්,මම යි මගේ පෝලිමේ මේ ඉන්න අනිත් යාළුවො තුන් දෙනයි."පන්ති නායිකාව කීවාය.

"හොඳයි මම ඔයාලට දෙන මාතෘකාව තමයි, ගෙවත්තට අලංකාර පොකුණක්. මේ ව්‍යාපෘති හැමෝම සහයෝගයෙන් එකතු වෙලා කරන්න ඕනි. කවුරුත් තමන්ගේ සහයෝගය මේ ව්‍යාපෘතිවලට නොදී ඉන්න බැහැ. ඔයාලා මේ හදන පොකුණ පොඩි තට්ටු කිහිපයක වතුර ගලාගෙන යන හෝ විහිදෙන එකක් වුණත් කමක් නැහැ. ඒකෙන් ඔයාලගෙ ලකුණු තවත් වැඩි කරගන්න පුළුවන්.

ඔයාලා ඔයාලගේ ගෙවත්තක හරි අවට පරිසරයේ හරි තැනක තමයි පොකුණ හදන්න ඕනි. ඒක කරන්න ඔයාලට දින තුනක කාලයක් ලැබෙනවා. ඔයාලා ඒ දින තුන ඇතුළත පොකුණ හදලා ඉවර කරන්න ඕනි" ගුරුතුමිය පැවසුවාය.

"හොඳයි දෙවැනි කණ්ඩායම කවුද?"ගුරුතුමිය යලිත් ඇසුවාය.

"මැඩම් අපි තමයි දෙවැනි කණ්ඩායම" ජෙසී සහ රෝසි ද බ්ලැක් සහ වයිට් ද එකවර පැවසූහ
.
හොඳයි ඔයාලට දෙන මාතෘකාව තමයි "ගසක් උඩ නිවසක්." ගුරුතුමී එසේ කියද්දී යහළුවන් මුහුණෙන් මුහුණ බලා ගත්හ.

"හා මැඩම්" රෝසි ගේ ද, බ්ලැක් සහ වයිට්ගේද, මුහුණු සතුටින් ඉපිලී තියෙද්දි ජෙසී කීවාය.

"හොඳයි ඔයාලටත් දින තුනක කාලයක් තමයි ලැබෙන්නේ මේ ව්‍යාපෘතිය අවසන් කරන්න."
මෙසේ ක්ලෝරා ගුරුතුමිය විසින් ඉතිරි කණ්ඩායම් තුනේ ද මාතෘකා බෙදා දුන්නාය.

"අපි මේ ව්‍යාපෘති නිමකිරීම තරගයක් විදිහට කරමු. අපගේ වටිනා තෑගි හොඳම ව්‍යාපෘති වලට දෙමු. එහෙම හොඳයි නේද?"ගුරුතුමිය ඇසුවාය.

"ඒක නම් හොඳ අදහසක් ජෙසිකා මැඩම්, අපිත් ආසයි මේ ව්‍යාපෘති තරඟයක් විදිහට කරන්න."ළමයි හැමෝම එක හඬින් පිළිතුරු දුන්හ.
"ළමයි ඔයාල මේ ව්‍යාපෘතිය අවසන් කරලා ඒ ව්‍යාපෘතිය ඡායාරූප පාසලට බාර දෙන්න ඕනි. ක්ලෝරා ගුරුතුමිය පැවසුවාය.

“හොඳයි ළමයි මම එහෙනම් ඔයාලට තරග නීතිරීති කියන්නම්.
ඔයාලට මේ ව්‍යාපෘති කරන්න අවශ්‍ය වන මුදල් ව්‍යාපෘති අනුව සාධාරණ විදියට පාසලෙන් ලබා දෙනවා.
ඒ වගේම ඔයාලට මේ ව්‍යාපෘති වලට ඔයාලගේ දෙමව්පියෝ හරි පවුලේ අය හරි සහභාගී කර ගන්න බැහැ. ඔයාලා තනියම තමා ව්‍යාපෘතිය ඉවර කරන්න ඕනි.
ඔයාල මේ ව්‍යාපෘති වලදී පරිසරයට කිසිම හානියක් කරන්නත් බැහැ.
ඒ වගේම ඔයාලත් හරි පරිස්සමින් වැඩ කරන්න ඕනි. ආයුධ එක්ක එහෙම වැඩ කරද්දි ප්‍රවේශම් වෙන්නත් ඕනි.
තවත් වැදගත් දෙයක් තමා ඔයාලට මේ ව්‍යාපෘති සිදු කරන්න අපේ 10 ශ්‍රේණි ගුරුමණ්ඩලය විදුහල්පති තුමාගෙන් අවසර ගත්තා.
ඒ වගේම ඔයාලට මේ ව්‍යාපෘතිය සිදු කරන්න පුළුවන් අපේ ගම ඇතුලෙ ස්ථානයකදී විතරයි.
ඒ සඳහා අපි ගමේ පිරිසගෙනුත් අවසර ගත්තා.

ළමයි මේ තමා තරග නීති රීති, ඔයාලා මේ නීති රීති වලට අනුකූලව ව්‍යාපෘතිය කරන්න ඕනි. ඔයාලා මේ නීතිරීති කඩ කළොත් එහෙම ඔයාලට ව්‍යාපෘතියෙන් වාර විභාගයට ලැබෙන ලකුණු අහිමි වෙන්නත් පුළුවන්.”මෙසේ දිගු විස්තරයක් කළ ක්ලෝරා ගුරුතුමිය පන්තියේ ඉදිරිපස පසෙකින් තිබූ ගුරු පුටුවේ වාඩි වූවාය.

“දැන් එහෙනම් ඔයාල කණ්ඩායමේ යාලුවොත් එක්ක ව්‍යාපෘතිය සිදු කරන විදිය ගැන කතා කරගන්න. හොඳටම මතක තියාගන්න ඔයාලට ව්‍යාපෘතිය ඉවර කරන්න දෙන්නෙ දින තුනක් විතරයි. ඊළඟ සඳුදා වනවිට අවසාන නොකරන ව්‍යාපෘති වලට ලකුණු ලැබෙන්නේ නැහැ.

එම කාලච්ඡේදය අවසන් වී අනිත් කාලච්ඡේද ආරම්භ වුවද ළමුන්ගේ සිතේ තිබුණේ පළමු කාලච්ඡේදය දී ගුරුතුමිය පැවසූ ව්‍යාපෘතිය ගැනය. කෙමෙන් කෙමෙන් පාසල අවසන් වීමට සීනුව නාද වන වේලාව එළඹිණි.
දැන් ඉතිරිව තිබෙන්නේ සවස 01:30 වීමට මිනිත්තු පහළොවක පමණ කාලයකි.

මේ වෙලාවේ බ්ලැක්, වයිට් සහ රෝසි තම කණ්ඩායම් නායිකාව වූ ජෙසී අසලට ඇදුනේ එම කණ්ඩායමේ ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කර ගැනීමටයි.

" ජෙසී, අපි අපේ ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කර ගන්නේ කොහෙදීද ?"ඒ ප්‍රශ්නය ඇසුවේ වයිට් ය.

"ම්.... ඔයාලා හැමෝම අපේ ගෙදර එන්න. අපි එහෙදී ව්‍යාපෘතිය ගැන කතා කර ගනිමු. අද සිකුරාදා නිසා හෙට හවස හතරට විතර ඔයාලට අපි ගෙදර එන්න පුලුවන්ද?"ජෙසී ඇසුවා ය.

"ඔව් අපිට පුළුවන්"යහළුවන් තිදෙනා ම එක හඬින් පැවසූහ.
"එහෙනම් ඔයාල හැමෝම හවස හතරට අපේ ගෙදර එන්න. අපි එහෙදි ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කරමු. අපි ඉරිදා වෙනකොට අපේ ව්‍යාපෘති අවසන් කරන්නත් ඕනි නේ."ජෙසී කීවාය.

එම සංවාදය අවසන් වෙනවාත් සමගම පාසල් අවසන් වීමේ සීනුව ද නාද විණි. එහෙයින් මිතුරියන් හතර දෙනා ම විසිරී ගියහ.

# ගහ උඩ ගෙදර

සෙනසුරාදා දිනය එළඹිණි. ජෙසී විසින් මීට සතියකට ඉහතදී තිබූ වාර විභාග දිනවලදී පිරිසුදු කිරීමට නොහැකි වූ ඇයගේ අපිළිවෙළ කාමරය පිරිසිදු කළේ අද ඇගේ යහළුවන් තිදෙනා ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කිරීමට නිවසට පැමිණෙනවා යැයි පැවසූ බැවිනි.

ඇගේ මේ කණ්ඩායම් හමුව සඳහා ජෙසීගේ මවගේ සංග්‍රහය ද නොඅඩුව ලැබුණි. ජෙසීගේ මව විසින් පෑන් කේක් සහ පලතුරු බීම බෝතලයක් ද ජෙසී වෙත ලබා දුන්නේ එම නිසයි.

පස්වරු හතර වීමට තවත් ඇත්තේ මිනිත්තු දහයක පමණ කාලයකි. ජෙසී තම කාමරය පිරිසිදු කිරීමෙන් අනතුරුව ඇගේ මම දුන් පෑන්කේක් සහ බීම බෝතලය ද ඇයගේ පොත් මේසය උඩ තැබුවාය. පසුව ඇය ඇගේ ඇඳෙහි ඉඳගත්තේ කාමරයක් කිරීමෙන් පසුව ඇති වූ වෙහෙස නිවා ගැනීම පිණිසයි. ඇඳ ළඟ ඇති ජනේලයෙන් පිටත බැලූ ඇයට දැක ගැනීමට හැකි වුණේ ලී වලින් සාදා තිබූ කුඩා ගේට්ටුවට උඩින් පැන මිදුල මැද ඇති කුඩා පාර දිගේ අත් අල්ලාගෙන ඇයගේ නිවසට පැමිණෙන බිලැක් සහ වයිට් නිවුන් සහෝදරියන් ය.

බිලැක් සහ වයිට් නිවුන් සහෝදරියන් දෙදෙනා ජෙසී ගේ නිවසේ දොරට තට්ටු කිරීමටත් පෙර ජෙසී දිවගොස් නිවසේ දොර ඇරියාය.

“මම මග බලාගෙන හිටියේ ඔයාලා එනකන්” ජෙසී සිනාමුසු මුහුණින් පැවසුවාය.

“අපි පරක්කු නැහැ නේද” එසේ ඇසුවේ වයිට්ය.
“රෝසි ආවා ද?” බිලැක් ඇසුවා ය.

“නෑ එයා තාම ආවේ නැහැ.”ජෙසී කීවාය.

මේ මිතුරන් තිදෙනාගේ සංවාදය ඇසුණු ජෙසීගේ සුරතලා වූ ෆෙදර් කුරුල්ලා ද නිවසට ආ අමුත්තන් දෙදෙනා වටා පියා සැලුවේය.

“ආ කොහොමද ෆෙදර්. කාලෙකට පස්සේ.”කියූ බිලැක් ඇයගේ අත ඉහලට ඔසවා එක ඇඟිල්ලක් දිගු කළාය.

ඒ දුටු ෆෙදර් අත්තක වසන කුරුල්ලෙකු මෙන් බිලැක්ගේ අතෙහි වැසුවේය.

ඒ දුටු යහළුවන් තිදෙනාටම මද සිනාවක් පහළ වූහ.

“මම අහන්නමයි හිටියෙ ජෙසී. ඇයි ඔයා මේ කුරුල්ලාට ෆෙදර් කියලා කියන්නේ.” ඒ පැනය ඇසුවේ බිලැක්ය

“ආ…මං එයාට ෆෙදර් කියලා කියන්නේ එයා පිහාටුවක් වගේ සැහැල්ලු නිසා. ඒක නිසා තමයි මම මෙයාට ෆෙදර් කියලා කියන්නේ”ජෙසී විසින් පිලිතුරු ලබා දුන්නාය.ඒ විතරක් නෙවෙයි ෆෙදර්ගේ හොට ගොඩාක් ශක්තිමත්.මෙයා එක සැරයක් මගේ ඔන්චිල්ලාවෙ ලණුවත් කැපුවා. ඇය තවදුරටත් කුරුල්ලා ගැන විස්තර කළාය.

තවමත් මේ යහළුවන් තිදෙනා සිටින්නේ නිවසේ දොර අසල ය. ඒ බව මතක් වූ ජෙසී යහළුවන්ට කාමරයට යෑමට ආරාධනා කළාය.

“අපි එහෙනම් දැන් මගේ කාමරේට යමු”ජෙසී පැවසුවාය.

මෙසේ ඔවුන් කාමරයට යෑමට සැරසෙන වත් සමඟම ඈතින් රෝසි කතා කරන හඬ ඔවුන්ට ඇසිණි.

“හෝව්,හෝව් පොඩ්ඩක් ඉන්න මමත් එනවා.”ඒ රෝසිගේ කටහඬයි.

රෝසි ද වේගයෙන් දුව විත් මිතුරන් සමග එක් වුණා ය. මිතුරන් සිව් දෙනාම ෆෙදර් කුරුල්ලත් සමඟ ජෙසීගේ කාමරය වෙත ගියහ.

“අපි ඉස්සෙල්ලාම ගහක් උඩ ගෙදරක් හදන්න හොඳ තැනක් හොයාගන්න ඕන. කවුද දන්නේ හොඳ තැනක් ගැන.”ජෙසී ඇසුවා ය.

“ම්.... මම හිතන්නේ මම හොඳ තැනක් දන්නවා” අපිට පුළුවන් නේ අපේ ගහක් උඩ ගෙදර ජෙසීගේ ගෙදරට එහා පැත්තේ තියෙන කැලේ හදන්න. එතකොට අපිට පහසුවෙන් යන්නත් පුළුවන්, ඒ වගේම අපේ ව්‍යාපෘතිය තියෙන තැන කවුරුත් හොයා ගන්නෙත් නැහැ. ඔයාලා කැමති ද ඒ අදහසට?” රෝසි ඇසුවා ය.

“ඒ අදහස නම් හොඳයි.”ජෙසී පැවසුවාය.

“අපිත් කැමතියි” බිලැක් සහ වයිට් නිවුන් සහෝදරියන් එකවරම පැවසූහ

“හා එහෙනම් අපි අදම වැඩේ පටන් ගනිමු.” අපට මේ ව්‍යාපෘතිය හදන්න අවශ්‍ය බඩු වලට මුදල් ඉස්කෝලෙන් ගන්න ඕනි නැති වෙයි. මොකද, මේ ව්‍යාපෘතියට අවශ්‍ය බඩු අපේ ගෙවල් වල ම තියෙනවානේ. අපි ඒවා පාවිච්චි කරලා ගෙදර හදමු. ඔයාලා කැමතිද ඒකට. ”ජෙසී ඇසුවාය.

“ඔව් අපි කැමතියි.”මිතුරියන් තුන් දෙනාම එකවර පැවසූහ.

“එහෙනම් අපි දැන් බඩු බාර ගනිමු.”ජෙසී පැවසුවාය.

“අපේ ගෙදර ගබඩා කාමරය හදන්න ගෙනාපු ලෑලි ගොඩක් ඉතුරු වෙලා තියෙනවා අපිට ඒවා මේ ගෙදර හදන්න ගන්න පුළුවන් වෙයි. මම ඒවා ගේන්නම්.” රෝසි පැවසුවාය.

“මම එහෙනම් ජනෙල් රෙදි සහ අපට මේ ගෙදර හදන්න අවශ්‍ය වෙන ඇණ මිටි වගේ දේවලුත් ගේන්නම්.”ජෙසී කීවාය.

මෙසේ පැවසූ රෝසි සහ ජෙසී බිලැක් සහ වයිට් දෙදෙනා වෙත හැරුණේ, “ඔයාලා මොනවද ගේන්නේ කියා අසන” ලෙසිනි.
එසේ ඔවුන් දෙදෙනා හැරෙනවිට නිවුන් සහෝදරියන් දෙදෙනා මුහුණට මුහුණ බලා ගනිමින් සංවාදයක් සිදු කරමින් සිටියහ.

“අපි තීන්ත ගේන්නම්”ඔවුහු පැවසූහ.

“හරි එහෙනම් අපි හෙට උදේම ව්‍යාපෘතිය පටන් ගනිමු.”ජෙසී එසේ කියූ පසු සියලුදෙනා ජෙසීගේ මවගේ සංග්‍රහය භුක්ති විඳ ඇයට ස්තූති කර විසිර ගියහ.

"පසුදින උදෑසනම ව්‍යාපෘතියට අවශ්‍ය අමුද්‍රව්‍ය රැගෙන ජෙසීගේ නිවසට පැමිණි යහළුවන් තිදෙනා ජෙසී සහ ඇයගේ කුරුල්ලා ෆෙදර් සමග ජෙසීගේ නිවස අසල ඇති කැලයට ගියහ.

"මෙහෙ ගෙදර හදන්න පුලුවන් ගස් ගොඩක් තියෙනවා අපි මොන ගහද තෝරගන්නේ." බිලැක් ඇසුවාය.

"මම මේ කැලයට කලින් ඇවිත් තිබුණේ නැහැ. මෙහෙ හරිම ලස්සනයි." රෝසි පැවසුවාය

"අපි හොඳ වෙලාවට ෆෙදර්වත් එක්කරගෙන ආවේ. එයා මේ කැලේ ගැන හොදට දන්නවනේ." වයිට් පැවසුවාය

ඒ සනාථ කිරීමට මෙන් ෆෙදර් ද දෙතුන් වතාවක් නාද කළේය.

ෆෙදර් ඔයාම කියන්නකො එහෙනම් අපේ ගහක් උඩ ගෙදර හදන්න හොඳ තැන."ජෙසී පැවසුවාය.

ජෙසී පැවසූ වදන වටහාගත් ෆෙදර් ඉදිරියට පියඹා ගියේය.

එය වටහා ගත් මිතුරන් සිව් දෙනාද ෆෙදර් පසුපස දිව ගියහ.

ෆෙදර් කුරුල්ලා පියඹා ගොස් නැවතුනේ ස්වභාවිකවම කුඩා වතුර පිරුණු වලක් සෑදී එහි මල් පිපී තිබූ පොකුණක් අසලය. ඒ අසල විශාල ගසක්ද විය.

"ෆෙදර් ඔයාගේ තේරීම නම් හරිම හොඳයි. මෙතැන හරිම ලස්සනයි. බිම තණකොළත් වැවිලා තියෙනවා. මිතුරියන් සිව්දෙනා ඔවුන්ගේ අදහස් මෙම ස්ථානය ගැන පළ කළහ.

"අර ලොකු ගහේ අපි අපේ ගෙදර හදමු."රෝසි සතුටින් පැවසුවාය.

"ඉස්සෙල්ලාම ගහට නගින්න පඩිපෙලක් හදාගමු. "ජෙසී පැවසුවාය.
"අපි මේ කැලේ තියෙන ශක්තිමත් දර අරගෙන ඉනිමග හදමු."ජෙසී පැවසුවාය.

"හොඳයි මම වයිට් එක්ක ගිහින් දර හොයාගෙන එන්නම්" බ්ලැක් පැවසුවාය.

සුළු මොහොතකට පසු මිතුරියන් සිව් දෙනා ඉණිමගේ කටයුතු නිම කළහ. ඒ සඳහා ෆෙදර් කුරුල්ලාගේ සහය ද නොඅඩුව ලැබුණි.

"මම දැන් එහෙනම් මේ ගහට නැගලා මේ ගසේ කුරුළු කූඩු එහෙම තියෙනවද කියලා බලන්නම්. කුරුලු කූඩු තිබ්බොත් අපි මෙතන අපේ ගහ උඩ ගෙදර හදන එක නවත්තලා වෙන තැනක හොඳ ගහක් හොයා ගනිමු. මොකද, මෙතන කුරුලු කූඩ තිබුණොත් අපි මෙතන ගෙදර හදන එක ඒ කුරුල්ලන්ට බාධාවක්."ජෙසී පැවසුවාය.

"මම එහෙනම් ගහට නගින්නම්" බ්ලැක් පැවසුවාය.
මේ ගහේ එකම එක කූඩුවයි තියෙන්නෙ ඒ කූඩුවේ කුරුල්ලෝ කූඩු අතහැරලා දාලා ගිහින්. ඒ කූඩුව හැර වෙන කූඩු මේ ගහේ නැහැ. අපිට පුළුවන් මේ ගසේ අපේ ගෙදර හදන්න."ඇය ගස පරීක්ෂා කර පැවසුවාය.

“එහෙනම් අපි මේ ගසේ ගෙදර හදමු” ජෙසී පැවසුවාය.

“හරි එහෙනම් අපි දැන් වැඩේ පටන් ගනිමු.” බ්ලැක් කීවාය.

දිනය අවසාන වන විට නිවස සෑදීමේ වැඩකටයුතු ද අවසන් වී තිබුණි.

“ඔන්න එහෙනම් අපි වැඩේ ඉවර කළා.”රෝසි පැවසුවාය.

“අපිට ගෙදර සැරසිලි ටිකත් ඉවර කරන්න පුළුවන් වෙච්ච එක ලොකු දෙයක්. නැත්නම් අපිට තවත් දවසක් මේක වෙනුවෙන් වැය කරන්න වෙනවා. ”ජෙසී පැවසුවාය

*අපේ මහන්සියේ ප්‍රතිඵලය නම් හරිම  ලස්සනයි” වයිට් සිනාසී පැවැසුවා ය.

එවිට ෆෙදර් කුරුල්ලා ද කිච් බිච් ගෑවේ වයිට්ගේ ප්‍රකාශය අනුමත කිරීමට මෙනි.

“හොඳ වෙලාවට අපිට හවස් වෙනකොට මේ වැඩේ ඉවර කරගන්න පුලුවන් වුණේ. හෙට සඳුදා නිසා අපට පුළුවන් අපේ ව්‍යාපෘතියෙ පින්තූරයක් අරගෙන අපේ  පන්ති භාර ගුරුතුමියටයි පන්තියේ යහළුවන්ටයි පෙන්වන්න. කොහොමත් ව්‍යාපෘතිය අවසන් කරන්න පුළුවන් අන්තිම දවස අද නේ.” ජෙනට් කීවාය.



“කවුරුහරි කැමරාවක් ගෙනාවා ද? අපේ මේ ව්‍යාපෘතිය පින්තූරයක් ගන්න.” රෝසි ඇසුවාය.

“ඔව් මම ගෙනාවා”ජේසී පැවසුවාය.

“මම එහෙනං පින්තූර ටිකක් ගන්නම්. අපි හෙට මේ පින්තූර අපේ පන්ති භාර ගුරුතුමියට පෙන්නමු.” ජේසී යළිත් පැවසුවාය.

ජේසී විසින් ව්‍යාපෘතියේ තත්ත්වය පැහැදිලි වන ආකාරයට පින්තූර කිහිපයක් ලබා ගත්තාය.

“හරි එහෙනම් දැන් අපි ගෙදර යමු. හවස් වෙන්නත් ළඟයි නේ.” බ්ලැක් සහ වයිට් එකවරම පැවසූහ.

“එන්න ෆෙදර් අපි ගෙදර යමු “අසල ගසකට වී අඹ ගෙඩියක් කමින් සිටි ෆෙදර්ට ජේසී පැවසුවාය.

හවස පහ පමණ වන විට සිව් මිතුරියන්ට නිවෙස් කරා යෑමට හැකි විය.

# තරග ප්‍රතිඵලය

නැවතත් නැවුම් සඳුදා දිනය එළඹිණි. එදින වෙනදාටත් පෙර සිවු මිතුරියෝ පාසලට පැමිණියහ. ඒ තමන්ගේ ව්‍යාපෘතියේ ඡායාරූප පන්ති භාර ගුරුතුමියට භාර දීමටත්, මෙම ව්‍යාපෘති තරගයේ ජයග්‍රහණය කවුරුන් සතු වේ ද යන්න දැන ගැනීමටත් ය.

"සුභ උදෑසනක් යාලුවනේ. මම අපේ ගුරුතුමිය කිව්ව විදිහටම උදේ හතයි තිහට කලින් අපි ගත්ත පින්තූර ටික බාර දුන්නා. මම දැක්කා අනිත් ළමයිනුත් පින්තූර භාර දෙනවා. අද අවසාන කාලච්ඡේදය දී තරග ප්‍රතිඵල කියනවා කියලා ජෙසිකා ගුරුතුමිය කිව්වා."ජෙසී කීවා ය.

"මම නම් හිතනවා අපිට හොඳ ප්‍රතිඵලයක් ලැබෙයි කියලා මොකද අපි ගොඩක් මහන්සි උනා නේ."රෝසි පැවසුවාය

"ඔව් හැබැයි අපි වගේම අපේ පන්තියේ අනිත් යාළුවො ගොඩක් මහන්සි වෙන්න ඇති. අපි බලමු කවුද දිනන්නෙ කියලා. හැමෝගෙම මහන්සියට සාධාරණ විදිහට ප්‍රතිඵලයක් ලැබෙයි." වයිට් පැවසුවාය.

උදෑසන සිට ප්‍රතිඵල කෙරෙහි නොඉවසිල්ලෙන් ගත කළ කාලයේ නිමාවිය. කාලච්ඡේදය උදාවිය.

"අන්න ගුරුතුමිය ප්‍රතිඵල අරගෙන එනවා." පන්ති නායිකාව වූ ලිලී පංතිය තුළට දුවවිත් පැවසුවාය.

ළමයින් හැමෝම පන්තියේ ඝෝෂාව නවත්වා තමන්ගේ අසුන්වල හිඳ ගත්හ.

“ළමයි ඔන්න එහෙනම් මම ප්‍රතිඵල අරගෙන ආවා. මම දන්නවා ඔයාලා දැන් ගොඩක් නොයිවසිල්ලෙන් ඉන්නේ කියලා. අපි තීරණය කළා එක දෙක තුන යන ස්ථාන වලට අමතරව සහභාගිත්වයටත් ත්‍යායාග ලබාදෙන්න. මොකද ළමයි හැමෝම මේ වෙනුවෙන් ගොඩක් මහන්සි වුනා’’ ක්ලෝරා ගුරුතුමිය පැවසුවාය.

“මම එහෙනම් දැන් ප්‍රතිඵල කියන්නයි යන්නේ…

තුන්වන ස්ථානය - ජෙනට් ඇතුළු කණ්ඩායම
දෙවන ස්ථානය - ලිලී ඇතුළු කණ්ඩායම” මෙසේ පවසා ගුරුතුමිය මදක් නිහඬව වූවාය. නමුත් පන්තියේ ඒ වන විටත් පිරී තිබූ අත්පොලසන් වර්ෂාව නම් නිම වී තිබුණේ නැත.

“ළමයි ඔන්න එහෙනම් මම ප්‍රථම ස්ථානය කියන්නයි යන්නේ.’’ අත්පොලසන් රාවය නිහඬ කරමින් ක්ලෝරා ගුරුතුමිය පැවසුවාය.

“10 ශ්‍රේණිය ව්‍යාපෘති තරගයෙන් ප්‍රථම ස්ථානය…
ජෙසී ඇතුළු කණ්ඩායම”ගුරුතුමිය සේ පවසනවාත් සමගම මුළු පන්ති කාමරය ම පෙර තිබුණාටත් වඩා විශාල වූ අත්පොළසන් නාදයකින් පිරෙන්නට විය.

මිනිත්තුවක පමණ කාලයක් පන්තිය තුළ රැඳී තිබූ ඒ අත්පොලසන් නාදය නැවතත් නිහඩ වූයෙ විදුහල්පතිතුමාගේ පැමිණීම නිමිත්තෙනි.

මුළු පන්තියම මීයට පිම්බාක් මෙන් නිශ්ශබ්ද විය.

විදුහල්පතිතුමා පන්තියට ඇතුළු වූ විගසම පැවසුවේ, "අපේ ජයග්‍රාහකයන්ට උණුසුම් සුබපැතුම්"කියාය.

ඒ සමඟ ම නැවතී තිබූ අත්පොළසන් නාදය යළිත් වරක් වැඩි වන්නට විය.

"කවුරුත් තමන් දිනුවේ නැහැ කියලා දුක් වෙන්න ඕනි නැහැ මොකද හැමෝටම සහභාගීත්වයට තෑගි අපි පාසලෙන් ලබා දෙනවා. ඒ වගේම අපි පාසලෙන් ඔයාලට ඊළඟ සඳුදා වෙනකම් කෙටි නිවාඩුවක් ලබා දෙනවා"විදුහල්පති තුමා පැවසුවේ ය.

ව්‍යාපෘතිය ජයග්‍රහණය කළ අය වෙනුවෙන් මිනිත්තු 30ක පමණ කෙටි උත්සවයක් හා තෑගි බෙදා දීමක් සංවිධානය කිරීමටද පාසලෙන් කටයුතු යොදා තිබුණි. එම උත්සවය අවසන් වනවාත් සමගම පාසල නිම වී මේ සීනුව ද නාද විය. මෙම උත්සවයේ ප්‍රීතිය හේතුවෙන් සිව් මිතුරියන්ට ඔවුනොවුන් සමග කථා කිරීමට පවා කාර්යබහුලත්වයක් ඇතිවිය. ඒ අනුව ඔවුන් පළමු වරට උත්සවයෙන් පසු කතා කළේ පාසල අවසන් වී නිවෙසට යන අතරතුරදීය.

"මම හිතුවා අපි දිනයි කියලා. මොකද අපි ගොඩක් මහන්සි උනා නේ. අපි මේකට ගොඩාක් ස්තුති කරන්න ඕන ජෙසීගේ සුරතලා ෆෙදර්ට. මොකද එයා නේ අපිට අපේ ගහක් උඩ ගෙදර හදන්න හොදම තැන පෙන්නුවෙ." බ්ලැක් පැවසුවාය.
"හොඳයි එහෙනම් අද හවසට හැමෝම අපේ ගහ උඩ ගෙදරට එන්න." ජෙසී පැවසුවාය.

"හා."අනෙකුත් මිතුරියන් තිදෙනා පැවසූහ.

# අමුත්තන් තිදෙනෙක්

සවස තුන පමණ වන විට රෝසී බ්ලැක් සහ වයිට් යන මිතුරියන් තිදෙනා ජෙසී ගේ නිවස පිටුපස ඇති කැලේ තිබෙන ඔවුන්ගේ ගහ උඩ ගෙදරට පැමිණියහ. ඔවුන් එම නිවසට පැමිණෙන විට ෆෙදර් කුරුල්ලා ද ගස වටා පියාඹමින් සිටියේ ජෙසීගේ පැමිණීම සංකේතවත් කරමිනි.

“ජෙසී....... ජෙසී......ඔයා ඉන්නවද?.”ඔවුහු ගස පාමුල සිට කතා කළහ.

“ඔව් මම ඉන්නෙ ගෙදර ඇතුලේ.”ජෙසී නිවස තුළ සිට පිළිතුරු දුන්නාය.

“හැමෝම උඩට එන්න ඔයාලට පුදුම කරවීමක් තියෙනවා.”ඇය නැවතත් පැවසුවාය.

මිතුරියෝ තිදෙනා අද යුහුසුළුව ගසට නැඟ ගස උඩ නිවස තුළ ඇති ආලින්දයට ගියහ.
ආලින්දයේ තිබූ මේසය මත කුඩා චොක්ලට් කේක් එකක් ද, බීම බෝතලයක් ද තිබිණි.

“නියමයි නෙ.”ඒ අලංකාර දර්ශනය දැක විස්මයට පත් වී සිටී රෝසි සතුටින් ඉපිලී කෑ ගැසුවාය.

නිවස වටා පියාසර කරමින් සිටී ෆෙදර් ද එම ශබ්දය නිසා නිවසේ ජනේලයකින් නිවස තුළට පැමිණියේය.

“මට හිතුන ඔයාලව පුදුම කරන්න. අපේ ජයග්‍රහණය වෙනුවෙන්.”ජෙසී පැවසුවාය.

“අපි එහෙනම් අපේ ජයග්‍රහණයේ සතුට සමරමු”ජෙසී යළි පැවසුවාය.

ඉතාමත් පිලිවෙලට මේසේ මත තිබූ චොක්ලට් කේක් එක කැපූ ජෙසී ,එය මිතුරන් තිදෙනා අතර බෙදා දී, ෆෙදර්ටද කොටසක් ලබා දී ඇයද කැබැල්ලක් ගෙන අනුභව කළාය.

පැයක පමණ කුඩා සැමරුමකින් පසු පස්වරු 4 පමණ වන විට ඔවුන් යළිත් නිවෙස් කරා පැමිණීම සඳහා ඔවුන්ගේ ගස උඩ නිවසින් පිටත්වූහ.

කැලේ තුළින් එන අතරමගදී විශාල අඹ ගසක් දුටු සිව් මිතුරියන්ගෙන්, රෝසිට අඹ කෑමේ ආශාවක් පහළ විය.

“අනේ අපි අඹ ටිකකුත් කඩාගෙන ම යමු.” අඹ ගස දැක ඉදුණු අඹ ගෙඩි වන් ඇස් ඇතිව රෝසි කීවාය.

“නෑ අපිට දැන් වෙලාවක් නැහැ දැන් හවස් වෙන්නත් එනවා. ඒක නිසා අපි ඉක්මනට යමු” ජෙසී කීවාය.

“අනේ එහෙම කියන්න එපා ජෙසී , ෆෙදර්ටත් ආස ඇති අඹ කන්න. ඒක නිසා අපි ටිකක් කඩා ගෙන යමු.” රෝසි යළිත් ඇයගේ අඹ කෑමේ ආශාව ඉෂ්ට කර ගැනීමට එසේ පැවසුවාය.

“කවුද එහෙනම් ගහට නගින්න ඉදිරිපත් වෙන්නේ. මටනම් අපේ ගහක් උඩ ගෙදරට නැඟලා බැහැලා හරිම මහන්සි.” ජෙසී පැවසුවාය.

“හරි මම නගින්නම්.” ඉතාමත් ත්‍රාසජනක හා තමා කැපී පෙනෙන වැඩ කිරීමට කැමති බිලැක් පැවසුවාය.

ඉතාමත් දක්ෂ ලෙස විශාල අඹ ගසට නැගී බිලැක් අඹ ගෙඩි කිහිපයක් මිතුරන්ට අල්ලා ගැනීමට පහතට දැමුවාය. පසුව ඔවුන්ට වඩා මීටර් විස්සක් පමණ ඈත තිබෙන යමක් දෙස බැලූ ඇය මෙසේ පැවසුවාය.

"අර බලන්න මිනිස්සු කට්ටියක් ආයුධ වගයක් අරගෙන කැලේ මැද ඉන්නවා. ඒ කට්ටිය මොකටද මේ වෙලාවේ ආයුධ අරගෙන කැලේ මැද ඉන්නේ. මේක කැලයට කවුරුත් එන්නේ නැහැනේ.."

"කෝ කොතැනද?"ජෙසී විමසිල්ලෙන් ඇසුවාය.

වහාම අඹ ගසින් බැස බිලැක් "අන්න අතන"කියමින් ඒ මිනිසුන් සිටින දිශාවට දිව්වාය.

අනෙකුත් මිතුරියන්ද ෆෙදර් කුරුල්ලා ද ඇය අනුගමනය කරමින් ඒ දෙසට දිව්වහ.

ඒ මිනිස්සුන්ට මීටර දහයක් පමණ ඈතින් වූ පඳුරකට මුවා වුණ සිව් මිතුරියන් හා ෆෙදර් කුරුල්ලා ඔවුන්ගේ සංවාදයට කන් දීගෙන සිටියහ.

"එයාලා පතල් වල වැඩ කරන ආයුධ වගයක් අරගෙන යනවා. ඒත් මේ පැත්තෙ පතලක් නැහැනේ. හැම පැත්තෙම තියෙන්නේ කැලේ විතරයි නේ." මිතුරියන්ට පමණක් ඇසෙන පරිදි වයිට් පැවසුවාය.

"ඒක නං ඇත්ත තමයි. හැබැයි ඒ කට්ටිය නගරෙට යනවා වෙන්න බැරිද.?"රෝසි ඇසුවා ය.



"වෙන්න බැහැ මේ පැත්තෙ නගරෙට යන්න බැහැ. මේ කැලෑව ගොඩක් ලොකුයි නේ." වයිට් පැවසුවාය.

"සද්ද කරන්න එපා අපි බලමු එයාලා මොනාද කතා වෙන්නේ කියලා." ජෙසී පැවසුවාය.

මේ අතර ආයුධ රැගත් මිනිසුන් තිදෙනා අතර මෙසේ සංවාදයක් ඇති විය.

"අපි මේ ආයුධ ටික අද රෑ වෙන්න කලින් පරණ මාලිගාවට අරගෙන යන්න ඕනෙ. එතකොට අපට අපේ වැඩේ හෙට උදේ වෙනකොට පටන් ගන්න පුළුවන්. කොහොමත් වැඩේ ඉවර වෙන්න මුලු දවසම යයි" එම මිනිසුන් ගෙන් එක් පුද්ගලයකු පැවසුවේය.

"මේ වැඩේ හරි ගියොත් අපිට අපේ ජීවිත කාලෙම සතුටින් ගෙවන්න පුළුවන්"භයානක සිනාවක් පාමින් තවත් එක් පුද්ගලයකු පැවසුවේය.

"හරි. පරක්කු වෙන්න හොඳ නැහැ අපි ඉක්මනට යමු. රෑ වෙන්නත් ලඟයි."තවත් එක් පුද්ගලයෙකු පැවසුවේය.

මෙසේ සංවාදය අවසන් කළ පුද්ගලයින් තිදෙනා කැලෑව මැදින් වැටී ඇති තරමක් වල් බිහිවූ පාරෙන් කැලය තුළ ඇති පරණ මාලිගාව දෙසට ගියහ.

මෙම සංවාදයට ඇහුම්කම් දී ගෙන සිටී සිව් මිතුරියන් විස්මයෙන් යුතුව මුහුණෙන් මුහුණ බලා ගත්හ.

එම පිරිස සිවි මිතුරියන් හා ෆෙදර් කුරුල්ලා සැඟවී සිටි පඳුරෙන් යම්කිසි ප්‍රමාණයකට දුරට ගිය පසු ජෙසී මෙසේ පැවසුවාය.

"ඔයාලට ඇහුනද ඒ කට්ටිය මොනවද කතා කරේ කියල?. ඒ කට්ටිය කරන්න යන්නේ නම් හොඳ දෙයක් වෙන්න බැහැ. සමහරවිට ඒ අය මාලිගාවේ තියෙන පුරාවස්තු මංකොල්ල කන්න ද වෙන්න ඇති හදන්නේ. නැත්නම් මොකටද ඒ අය මාලිගාවට පතල් වලට අවශ්‍ය ආයුධ අරගෙන යන්නේ." ඇය ඉතා බුද්ධිමත් උපකල්පනයක් ගෙන ආවාය.

"ඔව් එහෙම වෙන්න පුළුවන් ජෙසී , මොකද ඒ මාලිගාවට ආරක්ෂාවක් දාලත් නැහැ නේ." රෝසි පැවසුවාය.

"ඔව් අනික ඒ මාලිගාව ගොඩක් පරණයි. ගොඩක් පුරාවස්තු වගේම වටිනා දේවලුත් ඒ මාලිගාවේ ඇති. අපේ ගමේ කට්ටිය කවුරුත් ඒ මාලිගාවට යන්න නැත්තේ ඒ මාලිගාවේ හොල්මන් ඉන්නවා කියන නිසා." බ්ලැක් පැවසුවාය.

"අනේ මම නම් හොල්මන් වලට හරිම බයයි." වයිට් පැවසුවාය

"අපි කෝකටත් මේ සිද්ධිය ගැන පොඩ්ඩක් හෝදිසියෙන් ඉමු. මොකද කවුරුත් හොයලා බලන්නේ නැති වුණාට මේ මාලිගාව අපේ රටට ලොකු සම්පතක්." ජෙසී පැවසුවාය.

"එහෙනම් දැන් රෑ වෙන්නත් ළඟ නිසා අපි මේ සිද්ධිය ගැන අපේ ගෙදරට ගිහින් කතා කරමු" ජෙසී පැවසුවාය.

සිව් මිතුරියන් වේගයෙන් ජෙසී ගේ නිවස වෙත දිව ගියහ.ෆෙදර් කුරුල්ලා ද ඔවුන් පසුපස වේගයෙන් පියඹා ගියේය.

ජෙසීගේ කාමරය වෙත දිව ගිය ඔවුහු කාමරයට ගොස් හති ඇරියහ.

"හරි අපි දැන් මේ සිද්ධිය ගැන කතා කරමු."රෝසි පැවසුවාය.

"අපි මේක ගැන අපේ දෙමව්පියන්ට කියමුද?" රෝසි යෝජනා කළාය.

" බැහැ එතකොට ඒ කට්ටිය අපිට යන්න දෙන්නෙ නැතිවෙයි. මොකද ඒ මාලිගාවේ හොල්මන් ඉන්නවා කියන නිසා" ජෙසී පැවසුවාය.

"එහෙනම් අහගන්න. මේ සතියේ අපිට නිවාඩු නිසා අපි හෙට උදෙන්ම මේ මාලිගාවට යමු. එතකොට අපට පුළුවන් මොකක්ද මේ වෙන්නේ කියලා හොයාගන්න."ජෙසී පැවසුවාය.

"හරි අපිට පුළුවන් හෙට උදෙන්ම එන්න. උදේ හයට විතර වගේ හොඳද.?" බ්ලැක් සහ වයිට් පැවසූහ.

"ඔව් මටත් පුළුවන් ඒ වෙලාවට එන්න."රෝසි ද පැවසුවාය.

"හරි එහෙනම් මමත් උදේ 6:00 වෙනකොට සූදානම් වෙලා ඉන්නම්. ඔයාට උදේට එනකොට ඔයාලගේ බයිසිකල්වලින් එන්න. ඒක අපිට යන්න පහසුවක් වෙයි."ජෙසී පැවසුවාය.

“අපිට උපකරණ ටිකක් ඕනි වෙයි. හදිසි අවස්ථාවක පාවිච්චි කරන්න. හරියට පොඩි පිහියක්, ලණු, කෑම, වතුර, වගේ දේවල්. තව මතක් වෙන අවශ්‍ය වෙයි කියලා හිතෙන දේවල්. හැමෝම බාර ගනිමු.”ජෙසී යළිත් පැවසුවාය.

“හරි අපි එහෙනම් කෑම සහ වතුර ගේන්නම්. ”නිවුන් සහෝදරියෝ දෙදෙනා පැවසූහ.

“මම ලණු ගේන්නම්.”රෝසි පැවසුවාය.

“මම එහෙනං පිහියක් ගේන්නම්.”ජෙසී පැවසුවාය.

“එහෙනම් හැමෝම උදේ 6 වෙද්දි එන්න. දෙමව්පියන්ට කියන්න එපා ඔයාලා එනවා කියලා. එහෙම වුනොත් ඒ කට්ටිය අපට එන්න දෙන්නෙ නැහැ. මේ මාලිගාවේ හොල්මන් ඉන්නවා කියන නිසා ඒ කට්ටියත් මේ මාලිගාවට යන්න බයයි නේ”ඇය නැවත වරක් සිනාසී පැවැසුවා ය.

ඔවුන්ගේ මේ සාකච්ඡා අවසන් වන විට රාත්‍රී 7 පමණ වී තිබිණි. එහෙයින් ඔවුහු නිවෙස් කරා විසිර ගියහ.

# අභියෝගාත්මක දවසක්

පසු දින උදෑසන 6 වන විට මිතුරියෝ හතරදෙනාම ලෑහැස්ති වී පැමිණ සිටියහ.

“හැමෝම අවශ්‍ය බඩු ගෙනාවා නේද”ජෙසී ඇසුවාය.

“ඔව් මම ටෝච් එකකුත් ගෙනාවා.”රෝසි පැවැසුවාය .

“ඒක හොඳයි එහෙනම් අපි දැන් යමු.”ජෙසී පැවසුවාය.

සිව් මිතුරියන් ගමන සඳහා සැරසෙනවාත් සමග ම ෆෙදර් කුරුල්ලා පියඹා පැමිණ ජෙසීගේ උරහිස මත වැසුවේය.

“යාලුවනේ මෙයාටත් එන්න ඕනි වෙලා වගේ. අපි මෙයාවත් එක්කගෙන යමුද?” ජෙසී සිනාසෙමින් තම මිතුරන්ගෙන් ඇසුවාය.

“හරි ඔයත් එන්න ෆෙදර්”මිතුරියෝ තිදෙනා සතුටින් පැවසූහ.

පැයක පමණ දුර ගමනකින් පසු මිතුරියෝ මාලිගාව වෙත ළඟා වූහ. ඔවුන් තම බයිසිකල් වලින් ගමන පැමිණියේ නැත්නම් ඔවුන්ට පැයකටත් වඩා විශාල කාලයක් මාලිගාවට පැමිණීමට ගත කිරිමට සිදුවනු ඇත.

උදෑසන හත පමණ වන විට ඔවුන් මාලිගාවේ පිවිසුම් දොරටුව වෙත ළඟා වූහ.

“අපි මාළිගාවේ ඉදිරිපස දොරටුවෙන් යන්න හොඳ නැහැ. මේ මාලිගාවේ තැන් කවුරුත් ජීවත් වෙන්නේ නැති වුණාට, ඊයෙ අපි දැකපු මිනිස්සු සමහර විට මේ මාලිගාව ඇතුලේ ඉන්න පුළුවන්. ”ජෙසී තම ස්ථානෝචිත ප්‍රඥාව භාවිතා කර පැවසුවාය.

“ඔව් ඒක හොඳයි අපි බලමු මේ මාලිගාව වටේට තියෙන තාප්පයේ කොහේ හරි සිදුරක් තියෙනවද කියලා. එහෙම වුනොත් අපිට සිදුරෙන් මාළිගාව ඇතුළට යන්න පුළුවන්” බිලැක් පැවසුවාය.

“අනේ මටනම් හරිම බයයි ඇත්තටම මේ මාලිගාවේ හොල්මන් ඉන්නවද දන්නෙ නැහැ.” වයිටි භීතියෙන් පැවසුවාය.

“මේ මාලිගාවේ හොල්මන් නැහැ. මම පොඩි කාලේ මගේ කලින් ඉස්කෝලේ යාළුවොත් එක්ක මේ මාලිගාව ඇතුලේ සෙල්ලම් කරලා තියෙනවා. ”ජෙසී වයිටිගේ බිය අඩු කිරීමට තමා ගේ අත්දැකීමක් පැවසුවාය.

“හා එහෙනං කමක් නැහැ” වයිටි සැනසිලිදායක මුහුණකින් යුතුව පැවසුවාය.

“යාලුවනේ මෙන්න මෙතනින් තාප්පයේ පොඩි සිදුරක් තියෙනවා. අපි හතර දෙනාට මේ සිදුරෙන් මාලිගාවට යන්න පුළුවන්.”රෝසි පැවසුවාය.

මිතුරන් සිව් දෙනාම එම සිදුරෙන් මාලිගාවේ උයන වෙත ප්‍රවිෂ්ඨ විය. ෆෙදර් කුරුල්ලා බිත්තියට උඩින් පියඹා මාලිගාවේ උයන වෙත පැමිණියේය.

“හරිම විශාල මාළිගාවක්. හැබැයි දැන් ටිකක් පරණ වෙලා.” වයිට් පැවසුවාය.

“අපි දැන් මාලිගාවේ ප්‍රධාන දොර ළඟට ගිහින් බලමු එතන කවුරු හරි කෙනෙක් ඉන්නවද කියලා. ”ජෙසී පැවසුවාය.

මිතුරන් සිව් දෙනාද ෆෙදර් කුරුල්ලා ද ඉක්මනින් මාලිගාවේ ප්‍රධාන දොර අසලට ගියහ.

“මෙතන කවුරුත් නැහැ. අපි ප්‍රධාන දොරින්ම මාලිගාව ඇතුලට යමු.”රෝසි පැවසුවාය.

“කවුරුත් සද්ද කරන්න එපා. මොකද මේ මාලිගාව තුළ කවුරුහරි ඉන්නවනම්. එයාලා සද්ද කරන්නේ නැහැ. මොකද එතකොට මාළිගාවට කවුරු හරි කෙනෙක් ආවොත් දැනගන්නවා ඒ හොරු මේ මාලිගාවේ ඉන්නවා කියලා.”ජෙසී පැවසුවාය.

මාලිගාවේ බිම ඉතා ලිස්සන සුළු එකක් විය. ඒ එම ප්‍රදේශයට සුළු වර්ෂාධික කාලයක් එළඹී තිබීම නිසා විය හැකිය. සිව් මිතුරියන් ඉතාමත් අසීරුවෙන් ප්‍රවේශමෙන් අඩි තියා තරප්පු පෙළක් අසලට ගියහ.

“අපි මේ පඩිපෙල දිගේ උඩට යමු.” වයිට් පැවසුවාය.

“හරි, හෙමීට අඩිය තියලා සද්ද කරන්නැතුව යමු”රෝසි පැවසුවාය.

“මිතුරියෝ සිව්දෙනාම නිශ්ශබ්දව අඩි තියමින් තරප්පු පෙළ දිගේ ඉහලට ගියහ.

පඩිපෙලේ ඉහළ කෙළවර අවසන් වන තැන තිබුණේ විශාල කාමරයකි. මිතුරියෝ සිව් දෙනාද ෆෙදර් කුරුල්ලා ද කාමරය තුලට ගොස් සෝදිසි කළහ. එහෙත් ඔවුන්ට සොරුන් පිළිබඳව කිසිදු සාක්ෂියක් එම කුටියෙන් හමු නොවුණි.

"මේ කාමරේ කිසිම සාක්ෂියක් නැහැ නේ. අපරාදෙ අපි මේ මාලිගාවට ආවේ."රෝසි කනගාටුදායක මුහුණින් බ්ලැක් සහ වයිට් වෙත පැවසුවාය.

මේ අතර කාමරයේ බිම පරීක්ෂා කරමින් සිටී ජෙසීට සාක්ෂියක් ලැබිණි.

"යාලුවනේ මේ බලන්න"ඇය තමන්ගෙ මිතුරියන්ට ශබ්දය ඇසෙන නෑහෙන තරමට පැවසුවාය.

මිතුරියො තිදෙනා ම ජෙසී අසලට දිව ගියහ .
ජෙසී සොයාගෙන තිබුණේ භූගත පඩිපෙලක ආරම්භයේ ඇති දොරකි.

"මේක නම් ගොඩක් හොඳ හෝඩුවාවක්." බ්ලැක් පැවසුවාය.

"අපි මේ පඩි පෙළෙන් පහලට යමු"ජෙසී පැවසුවාය.

"ඒක නම් හොඳ අදහසක් නෙමෙයි ."වයිට් භීතියෙන් යුතුව පැවසුවාය.

"බයවෙන්න එපා. මේ පඩිපෙලේ හොල්මන් නැහැ" රෝසි වයිට් වෙත බලමින් සමච්චලයට සිනා වූවාය.

"හරි අපි එහෙනම් දැන් යමු"ජෙසී පැවසුවාය.

# කරදරයක්

මිතුරියෝ සිව්දෙනා එකිනෙකා පිටුපස තරප්පු පෙළ බැසීමට සූදානම් වනවාත් සමගම ෆෙදර් කුරුල්ලා ජෙසීගේ උරහිස මත වැසුවේය.

"ෆෙදර් ඔයා කොහෙවත් යන්න එපා." ජෙසී කුරුල්ලාගේ පිට අතගාමින් ආදරයෙන් පැවසුවාය.

ඒ බව තේරුම් ගිය කුරුල්ලා ද "කිචි බිචි"හඬ නිකුත් කළේය.
එම තරප්පුපෙල අවට ඉතා අඳුරු විය. රෝසිගේ විදුලි පන්දම මිතුරියන්ට අවශ්‍ය වූයේ එවිටය.
සිව් මිතුරියෝ විදුලි පන්දම භාවිතයෙන් අවට බලමින් තරප්පු පෙළ බැස්සහ. එම පඩිපෙළ ඉතා දිග එකක් විය. එමෙන්ම තරප්පු පෙළ දෙපස බිත්තියේ සහ තරප්පු පෙළට ඉහළින් ඇති බිත්තියේ අලංකාර චිත්‍ර හා අකුරු ඇඳ තිබුණි. සිව් මිතුරියන් මෙසේ ඉදිරියට යන විට ඔවුන්ගෙ වම් අත පැත්තෙන් දොරක් විය. ඔවුන් එතැන නැවතී නැවතත් සංවාදයක යෙදෙන්නට විය.

"අපි මොකද කරන්නේ මේ පඩිපෙළ තව පහලට තියෙනවා. මෙතන අපේ වම් අත පැත්තෙන් දොරකුත් තියෙනවා. අපි කොහෙටද යන්නේ." ජෙසී ඇසුවාය.

"අපිටත් හිතාගන්න බැහැ"මිතුරියෝ තිදෙනා ද පැවසූහ.

මේ අතර ජෙසීගේ උරහිස උඩ සිටි ෆෙදර්ට කොහේදෝ සිට පැමිණි කරදරකාර මැස්සෙක් කරදර කරන්නට විය. ඒ කරදරය ඉවසා දරාගත නොහැකි වූ ෆෙදර් පියඹා ගොස් මැස්සා අල්ලන්නට විය.

මෙසේ එකවර පියෑඹූ ෆෙදර් පිළිබඳව බිය වූ සිව් මිතුරියන් ෆෙදර් පසුපසින් පඩිපෙළ දිගේ පහළට දිවූහ. පියඹා යන ෆෙදර් දෙස උඩ බලමින් දුවමින් සිටි සිව් මිතුරියන්ට මහා අකරතැබ්බයකට මුහුණ දෙන්නට විය.ඔවුන් දුවමින් පඩිපෙලේ අවසාන කෙළවරට ළඟා වෙන්නට විය. පඩිපෙළ අවසාන වී තිබුනේ බිමට තරමක් ඉහළිනි. පඩිපෙළ අවසානයේ ලණුදැල් සහිත විශාල උගුලක් අටවා තිබුණි.ෆෙදර් දෙස බලමින් දිවූ සිව් මිතුරියෝ එම දැලට අඩිය තියත්ම මේ උගුලට හසු වූහ. ඔවුන් දුව ආ පිළිවෙලටම පළමුව වයිට්, දෙවනුව බ්ලැක්, තෙවනුව රෝසි, සිව්වනුව ජේසී ද උගුලට ඇද වැටුණහ.මිතුරියෝ මල්ලකට වැටුණු අඹ ගෙඩි මෙන් මෙම ලණුදැල් උගුලෙහි සිරවුණහ. මේ නිසා ඔවුන්ට සෙලවීමට පවා නොහැකි විය.මෙය දුටු ෆෙදර් කුරුල්ලා මැස්සා පසුපස එලවීම නවත්වා, උගුලෙහි සිරවී සිටි තම මිතුරියන් දෙසට පැමිණියේය.

"අයියෝ ෆෙදර් ඔයා හින්දා තමයි අපි මේ කරදරේට පැටලුණේ. දැන් අපි කොහොමද මේකෙන් එළියට එන්නේ."බ්ලැක් හඬන්නට සැරසෙමින් පැවසුවාය

"පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. මට අදහසක් ආවා"ජේසී පැවසුවාය."රෝසි ඔයා ළඟ තියෙන ලණුව අරගෙන මේ උගුලේ, ඔයාගේ ලණුවේ එක කොනක් ගැටගහන්න. අනිත් කොන ඊට පස්සේ උගුලෙන් පහළ බිමට දාන්න. ඒකෙන් අපිට පුළුවන් පහළට බහින්න. නැත්නම් අපිට වෙන්නේ එකපාරට බිමට වැටිලා මේ බිම තියන උල් ඇඟේ ඇනගන්න."මෙසේ පවසා ජේසී ඇයගේ ඇඳුමේ සාක්කුවෙන් ඇය ගෙනා පිහිය අතට ගත්තාය පසුව නැවත මෙසේ පැවසුවාය.

"හරි, රෝසි ඔයා මේ පිහිය බිලැක්ට දෙන්න. බිලැක් ඔයා ඒ පිහිය වයිට්ට දෙන්න. වයිට් ඔයා ඔය පිහිය අරගෙන උගුල යටින් කපන්න.. ප්‍රවේශමෙන් කපන්න නැත්නම් අපි හැමෝම එකවර මේ බිම හිටවලා තියෙන උල් උඩට වැටෙයි." ජෙසී පැවසුවාය.

මේ අතර ෆෙදර් තවමත් කෑගසමින් උගුළ වටා පියාසලයි.ඒ තම මිතුරියන්ට මේ අකරතැබ්බයකට මුහුණ දෙන්නට සිදු වූයේ තමන් නිසා යැයි යන හැඟීම ෆෙදර්ගේ හිතට දැනෙන බැවිනි.

අවට ඇති අඳුර අතරින් විදුලි පන්දමේ එළියෙන් පමණක් මෙම කාර්ය සිදු කිරීමට සිදුවීම වයිට් හට මහත් බාධාවකි. එමෙන්ම ඇය සුළු දෙයටත් බිය වන අන්දමේ ගැහැනු ළමයෙකි. ඇය විදුලි පන්දමේ එළියෙන් සහ වෙව්ලන අත්වලින් යුතුව උගුල පහලින් කැපීම ආරම්භ කළාය. එහෙත් ඇයට එය වැඩි වේලාවක් කිරීමට සිදු නොවීය. මොකද, ඇයගේ අතේ දැඩි වෙව්ලීම හේතුවෙන් පිහිය ඇගේ අතින් ගිලිහී බිමට වැටිණි.

මෙය සිව් මිතුරියන්ගේ කණ්ඩායමට දැඩි බලාපොරොත්තු ගිලිහීමක් විය.

ජෙසීගේ හැර අනිත් මිතුරන් තිදෙනාගේ ම බලාපොරොත්තු සුනු විසිනු වී ගොස් තිබිණි. රෝසි බිලැක් සහ වයිට් යන මිතුරියෝ අඬන්නට මෙන් දෑස් වල කඳුළු පුරවාගෙන සිටියහ. එහෙත් ජෙසීට එම අවස්ථාවේදී තවත් උපායක් කල්පනා විය.

"යාලුවනේ අඬන්න එපා මට තවත් උපායක් කල්පනා වුණා." ඇය පැවසුවාය.



“ෆෙදර් ඔයාට පුලුවන්ද මේ උගුලේ පහලින්ම තියෙන ලණු ටික කපන්න.” ජේසී ෆෙදර්ගෙන් ඇසුවාය.

ෆෙදර් “ඔව්“ කියන්නාක් මෙන් “කිචි බිචි”ගෑවේය.

ඒ සමගම මිතුරියන් තිදෙනා ගේ මතකයට ආවෙ දින කිහිපයකට පෙර ජේසී ඇගේ නිවසේදී ෆෙදර් ගැන කියූ කතාවයි.

ඒත් සමගම මිතුරියන් තිදෙනාටත් ජේසීටත් සතුටු සිනා පහළ විය.

“එහෙනම් හැමෝම හයියෙන් මේ දැල අල්ලගන්න. ෆෙදර් උගුල කැපුවට පස්සේ එක එක්කෙනා මේ උගුලෙ අපි ගැට ගහලා තියෙන ලනුවෙන් බිමට බහින්න.”ජේසී පැවසුවාය.

ෆෙදර් ඉතා දක්ෂ ලෙස ඉක්මනින් උගුලේ පහළ කොටස කැපුවේය.

ඒ නිසා මිතුරියො සිව්දෙනාම ප්‍රවේශමෙන් උගුලෙන් ගැලවී ලණුව දිගේ පහළට බැස ගත්හ.

අවසානයේ ජේසී පහළට බැස්ස පසු ෆෙදර් ජේසීගේ උරහිස මත වැසුවේය.

“බොහොම ස්තූතියි ෆෙදර්.” මිතුරියෝ සිව්දෙනාම එකවර පැවසූහ.

එම ප්‍රශංසාව පිළිගත් ෆෙදර් කුරුල්ලා ද සතුටින් කිචි බිචි ගෑවේය.

මේ සිද්ධි දාමය අවසන් වන විට දවසින් බාගයක්ම ගෙවීගොස් තිබිණි.
ඔවුන් උගුලෙන් ගැලවී, බැස තිබුණේ බිම උල් සවිකර තිබූ කාමරයට ය එම කාමරයේ සිවිලිම වූයේ මිතුරියන් පෙර අසුවූ ලණුදැල් උගුලයි.
"මම හිතන්නේ මේ උල් නම් රජ කාලේ ඉඳලම තියෙන ඒවා වෙන්න ඇති. හැබැයි මේ ලනු දැල් උගුල නම් අලුතෙන් හදපු එකක් වෙන්න ඕනි. මොකද රජ කාලේ ලණු නම් මේ වෙනකොට දිරලා තියෙන්න ඕනේ." ජෙසී පැවසුවාය.

"පොඩ්ඩක් ඉන්න පොඩ්ඩක් ඉන්න. මේ මෝඩ උගුල නිසා මගේ ඇඳුමත් කිළිටි වෙලා. ඔහොම ඉන්න මම වෙන ගවුම් දෙකක් ගෙනාවා ඒකෙන් එකක් මාරු කරගන්කන්." හැමදාමත් සුදු පාට ඇඳුම් අඳින වයිටි පැවසුවාය.

"එපා එපා දැන්ම එපා. කවුද දන්නේ අපිට තව මොන වගේ කරදර වලට පැටලෙන්න තියෙනවද කියලා. ඒක නිසා ඒ ඇඳුම මාරු කරගන්න එපා. "ජෙසී වයිට්ට පැවසුවාය.

"අර බලන්න මේ කාමරේ කොනේ වහපු දොරක් තියෙනවා. අපි ඒ දොරෙන් එළියට යන්න බලමු" රෝසි කාමරය කොණේ තිබූ වැසූ දොර දෙසට අත දිගු කරමින් පැවසුවාය.

"සමහරවිට ඒ දොරෙන් එළියට යන්න පුළුවන් ඇති. අපි ඉක්මනට යමු" බ්ලැක් පැවසුවාය.

මිතුරියන් සිව්දෙනා කුරුල්ලත් එම දොර අසලට ගියහ. ජෙසී එම දොර ඇරියාය. එම දොර ඉදිරියේ තිබුනේ ඉහළට විහිදුණු තවත් තරප්පු පෙළකි. දොර විවෘත කළ විගස ම මෙම මිතුරියන්ට තරප්පු පෙළ ඉහළ මිනිසුන් කිහිප දෙනෙකුගේ කතා හඬ ඇසිණි.

# හාස්‍යජනක සිද්ධියක්

මිතුරියන් සිව්දෙනා සහ කුරුල්ලා වෙන කෙනකුට ශබ්දය නොඇසෙන පරිදි සෙමින් නිශ්ශබ්දව පඩිපෙළ නැඟ ඉහලට ගියහ.
ඔවුන් පඩිපෙළ නැග ඉහළට ගිය පසු ඔවුන් ඉදිරියේ තිබුනේ මීටර් විස්සක් පමණ දිගු කොරිඩෝවකි. එම කොරිඩෝවේ අනෙක් කෙළවර මිනිසුන් තිදෙනෙක් කතා කරමින් පොළොව හාරයි.
ඒ මිතුරියන් පෙරදින කැලේදී දුටු මිනිසුන් තිදෙනායි ඔවුන් එදින රැගෙන ආ පතල් කනින ආයුධ ද රැගෙන පොළොව හාරයි.
සිව් මිතුරියො එම පුද්ගලයින් දුටු සැණින්ම යළිත් පඩිපෙළ අසල සැඟවුණාහ.

"කවුරුත් සද්ද කරන්න එපා. අපි අහගමු එයාලා මොනාද කතා කරන්නේ කියලා" ජෙසී පැවසුවාය.

"මටනම් හරිම බයයි ඒ කට්ටිය අපිව අල්ල ගනීද දන්නේ නැහැ." වයිට් භීතියෙන් යුතුව පැවසුවාය.

"කවුරුත් සද්ද කරන්න එපා අපි සද්ද කරොත් තමා එයාලා අපිව හොයාගෙන අල්ලගන්නේ" ජෙසී උපක්‍රමශීලීව පැවසුවාය.

මේ අතර පොළොව කණින පුද්ගලයින් තිදෙනා අතර මෙසේ සංවාදයක් ඇති විය.

"දැන් වෙලාව හවස තුනයි. අපි හවස 5 විතර වෙනකොට වත් මේ නිධානය අරගෙන ඉවර වුනොත්, අපිට අද රෑ වෙනකොට මේ ගමෙන් පිටවෙලා යන්න පුළුවන්. එතකොට පොලිසියටවත් බැහැ අපිව හොයා ගන්න. මොකද, කවුරුත් මේ මාලිගාවට එන්නෙත් නැහැනෙ." එක් පුද්ගලයෙක් පැවසුවේය.

"මේ.. මම ඉතුරු ආයුධ ටික අරගෙන එන්න අර කාමරේට යන්නම්" එක සොරෙක් එසේ පවසා ඔවුන් පොළොව කැණීම් කරන ස්ථානයේ කොරිඩෝවේ තිබුණු කාමරයක් තුළට ගියේය.

ඔහු එසේ එම කාමරය තුළට ගියේ "හොඳ විහිළුවක් කරන්නම්" ලෙස ඔහුගේ සොර සගයන්ට නොඇසෙන පරිදි කියමින් කාමරේ දොර වසා ගනිමින්ය.

ඒ වචන ස්වල්පය ඔහුගේ සොර සගයන්ට නොඇසුණමුත් ඒ අසල සිටි සිව් මිතුරියන්ට නම් පැහැදිලිව ඇසිනි.

මෙසේ සුළු වේලාවකට පසු කාමරය තුලට ගිය සොරා, "අනේ මාව බේරගන්න මෙන්න භූතයෙක්" කියමින් කාමරය තුළ සිට කෑගැසුවේය.

ඒ ශබ්දය ඇසුණු පොළොව කැණීම කරමින් සිටි අනිත් සොරු දෙදෙනා ද එම කාමරය තුළට දිව ගියේ "මොකද ? මොකද?" ඇයි කලබලයෙන් පවසමිනි.

ඔවුන් දෙදෙනා දොර වසා තිබු කාමරේ දොර විවෘත කරනවාත් සමගම කාමරය තුළ සිටි සොරා භයානක ඝෝෂාවක් වැනි හිනාවක් නගමින් කාමරයෙන් එළියට පැන්නේය.

එය දැක බිය වූ ඉතිරි සගයන් දෙදෙනා "මෙන්න යකෙක්" කියමින් කොරිඩෝවේ හිස් ලූ ලූ අත දිවීමට පටන් ගත්හ.



එම සිද්ධිය නිසා තම සිනහව නවතා ගත නොහැකි වූ තම මිතුරන් බිය කළ සොරා "එයි මම යකෙක් නෙමෙයි" යැයි සිනාසෙමින් ම පැවසුවේය.

එය ඇසූ සොරුන් දෙදෙනා "බොරුවට බය කරනවනෙ" යනුවෙන් පවසා ආපසු පොළොව කැණීම ආරම්භ කළහ.

එම සිද්ධිය දුටු සිව් මිතුරියන්ටත් නවත්වාගත නොහැකි සිනාවක් පහළ විය. එහෙත් ඔවුන් ඒ සිනාව සොරුන් තිදෙනාට එසේ යැයි බියෙන් ඉමහත් අසීරුවෙන් මැඩගත්හ.

එම හාස්‍යජනක සිද්ධිය නිසා සොරුන් තිදෙනා අතර සංවාදයක් ඇති විය.මෙසේ එම පුද්ගලයන් තිදෙනා සංවාද කරන අතරේ සිව් මිතුරියන් අතර ද කෙටි සංවාදයක් ඇති විය. එහෙත් සිව් මිතුරියන්ගේ සංවාදයේ ශබ්දය අර සොරු තිදෙනාට ඇසුනේ නැත. ඒ, එම සොරුන් තිදෙනාගේ සංවාදයේ ඝෝෂාව සිව් මිතුරියන්ගේ සංවාදය ශබ්දයට වඩා වැඩි බැවිනි.

"යාලුවනේ මට හොඳ අදහසක් ආවා මේ හොරු තුන්දෙනාව පොලිසියට අල්ලලා දෙන්නත්, අපිට මෙතනින් පිට වෙන්නත්. හොඳම අදහසක්"ජේසී පැවසුවාය

# හොඳ උපායක්

“මොකක්ද” යාළුවන් තිදෙනාම එකවර ඇසූහ.

“මේකයි මගේ සැලැස්ම. මටනම් හිතෙන විදිහට මේ මිනිස්සු හොල්මන් වලට ගොඩක් බයයි වගේ. මොකද කියන්නේ යාලුවනේ අපි මෙයාලට ඇත්ත හොල්මන් පෙන්නමු ද?”ජේසී පැවසුවාය.

“නියමයිනෙ ඒ කොහොමද?”රෝසි විමතියෙන් ඇසුවාය.

“මෙහෙමයි. අපේ වයිට් ළඟ අමතර සුදු ඇඳුම් දෙකක් තියෙනවා කිව්වා නේද?. අපි ඒ ගවුම් 2 අපේ කණ්ඩායමේ ඉන්න එක වගේ දෙන්නෙක් ට අන්දමු. ඊට පස්සෙ අර හොරු තුනෙදෙනාව බය කරල එලවමු”

“කවුද අනේ ඒ එක වගේ දෙන්නා?” බ්ලැක් නොදන්නා ආකාරයට ඇසුවාය.

“වෙන කවුද ඉතින් බ්ලැක් සහ වයිට් කියන නිවුන්නු දෙන්නා තමයි.”රෝසි එසේ කියමින් බ්ලැක් සහ වයිට් දෙස සිනාමුසු මුහුණින් බැලුවාය.

“ඊයා….. මම කැමතිම නැති පාට සුදු.”බ්ලැක් ඇඹුල් වූ මුහුණින් යුතුව පැවසුවාය.

“ඔයාලා කොහොමහරි අපේ ගම සහ රට වෙනුවෙන් මේක කරන්න ඕනි “ජේසී ඔවුන්ව දිරිමත් කළා ය.

“ මට තව හොඳ අදහසක් ආවා. වයිට් එක සුදු ගවුමක් ඇඳන් ඉන්න නිසා එයාට තව එකක් ඕනි වෙන්නෙ නැහැනෙ.බ්ලැක්ටත් එක සුදු ගවුමක් ඇති. අපි අනිත් සුදු ගවුම ෆෙදර්ට අන්දවමු” ජෙසී පැවසුවාය.

“ෆෙදර්ට” මිතුරියන් තිදෙනා ම විස්මයෙන් යුතුව ඇසූහ

ජෙසීගේ එම ප්‍රකාශය ඇසුණු ෆෙදර්ද අමුතු කටහඬකින් “ක්වෑක්“ යන අනුකරණයෙන් යුතුව නාද කළේය. එම ශබ්දයෙන් ෆෙදර්ගේ විස්මය හොඳින්ම ප්‍රකාශ විය.

“ඔව් ෆෙදර් ඔයාව අපි භූතයෙක් කරන්න යන්නේ”ජෙසී සිනාසෙමින් පැවසුවාය.
“බ්ලැක්, එහෙනම් ඔයා මේ සුදු පාට ගවුම ඇඳගන්න”ඇය යළිත් පැවසුවාය

ඇය ඉතාමත් අකමැත්තෙන් අසල තිබූ කාමරයට ගොස් එම සුදු පැහැති ගවුම ඇඳගෙන පිටතට පැමිණියාය.

“හරි ෆෙදර් එහෙනම් දැන් ඔයාගේ වාරේ.”ජෙසී එසේ කියමින් වයිට්ගේ සුදු පැහැ ගවුම පිළිවෙලකට කුරුල්ලාට ඇන්දුවා ය.
ඒ එම කුරුල්ලාගේ පියෑඹීමේ පහසුවට හානියක් නොකරමිනි.

“ෆෙදර් ඔයාට පියාඹන්න පුළුවන් නේද” ඇය ඉතාමත් ආදරයෙන් කුරුල්ලා ගෙන ඇසුවාය.

එම පැනය වටහාගත් ෆෙදර්ද “ඔව්”කියන්නාක් මෙන් “කිච් බිච්” ගෑවේය

# උපක්‍රමය සාර්ථකයි

සොරුන් පැරදවීමට සියලු කටයුතු දැන් සූදානම්ය. සොරුන් තිදෙනාද තවමත් කතා කරමින් පොළොව කැණීම් කරමින් සිටි.

"රූපලාවන්‍ය ක්‍රම රැසක් දන්නා රෝසි විසින් තම නිවුන් මිතුරියන්ගේ මුහුණු අවට තිබූ දුහුවිලි හා දැලි භාවිතයෙන් යක්ෂ මුහුණු බවට පත් කළාය.

දැන්නම් නිවුන් සහෝදරියන් දෙදෙනා සැබෑම ම හොල්මන් වැනිය.

ෆෙදර් ද වයිට්ගේ සුදු පැහැ ගවුම ඇඳ පියෑඹූ විට හිස,අත්, කකුල් නැති සැබෑම හොල්මනක් වැනිය.

"හරි.. ෆෙදර්...පළවෙනි අවස්ථාව ඔයාගේ. ඔයාට හොරු තුන්දෙනා ඉස්සරහට ගිහින් පියාඹන්න" ජෙසී පැවසුවාය.

ඒ වචනය පිළිගත් කුරුල්ලා සොරුන් තිදෙනා ඉදිරියට ගොස් හොල්මනක් ලෙස රඟපෑවේය. එය දැක බිය වූ එක් සොරෙක් තමා පොළොව කැණීම් කරමින් සිටි ආයුධය ගෙන ෆෙදර් ඇඳගෙන සිටි ගවුමේ බඩ ප්‍රදේශයට පහරක් එල්ල කළේය. එහෙත් ඒ ප්‍රහාරය ෆෙදර්ට නොවැදුණි. මොකද ෆෙදර් යනු ඉතා කුඩා කුරුල්ලෙකි. සොරාගේ එම ප්‍රහාරය නිසා ගවුමේ කැබැල්ලක් ඉරිණි. එයින් බියට පත් වූ එක් සොරෙක් එතැනම කලන්තය දමා වැටුණේය.
ඉතිරි සොරුන් දෙදෙනාගේ බියවීම කොපමණ වේද යත්, බිම වැටුන සොරා ගැන ඔවුන්ට ගානක් වත් නැත. එම සොරුන් දෙදෙනා කොරිඩෝවේ ඔවුන් සිටි කොනේ සිට මිතුරියන්ගේ කණ්ඩායම සිටින කොන වෙතට වේගයෙන් දිව ආවහ

ඒ අතරතුර ජෙසී තම සිව් මිතුරියන් සමඟ තවත් සැලසුමක් හදා ගත්තාය .

දැන් එම සැලසුම ක්‍රියාත්මක කරන වෙලාවයි.

මෙසේ සොරුන් දෙදෙනා පඩිපෙළ දෙසට දිව එන අතරතුර ජෙසී,
බ්ලැක්ට "පඩිපෙලේ ඉහළ කෙළවර සිටින්න"යැයි පවසා වයිට්ට "පඩිපෙලේ පහල කෙළවර සිටින්න" යැයි පැවසුවාය.

එසේ පවසා ජෙසී සහ රෝසි පඩිපෙළ යට සැඟ වුණාහ.

සැලසුමේ ආකාරයට ඉතිරි සොරුන් දෙදෙනාත් මේ නිවුන් හොල්මන් දෙකට බය වූ පසු තරප්පු පෙළ අසල තිබෙන කාමරේට දිව යා යුතුය. එවිට සිව් මිතුරියන් එක්ව එම කාමරයේ දොර වසනු ඇත. එවිට ඉතිරි සොරුන් දෙදෙනාද කාමරය තුළ කොටු වෙයි. කලන්තෙ දැමූ සොරා තවත් කාමරයක සිර කරනු ලබයි. එවිට සොරුන් තිදෙනාම නීතියේ රැහැනට අසුකර දිය හැක.

ඉතිරි සොරුන් දෙදෙනාද කොරිඩෝව දිගේ පඩිපෙළ දෙසට දිව ආවහ. එවිට එකවරම බ්ලැක් පඩිපෙළ අසළ සැඟවී සිට සොරුන් දෙදෙනාගේ ඉදිරියට පැන්නාය. බ්ලැක්ට බය වූ සොරුන් දෙදෙනා පඩිපෙළ දිගේ පහළට දිව ආහ. එවිට වයිට් ද පඩිපෙළ යට සිට එළියට පැන්නාය. එක වගේ හොල්මන් දෙකක් දැකීමෙන් බියට පත්වූ සොරුන් දෙදෙනා ජෙසීගේ සැලසුමේ ආකාරයටම පඩිපෙළ අසළ ඇති කාමරේට දිව්වහ. ඒ සැණින් ම සිවු මිතුරියන් එම කාමරය දොර වැසුවහ.

සිව් මිතුරියන් කාමරයේ දොර වසා දැමූ පසු'' ෆෙදර් කුරුල්ලා ද මිතුරියන් අසලට පැමිණියේය. ජෙසී විසින් ෆෙදර් ඇඟ සිටි ගවුම ගැලෙව්වාය.

පසුව මිතුරියො විසින් කලන්තය දමා සිටි සොරාවද කාමරයකට දමා දොර වැසුහ.

පසුව ඔවුන් සොරුන් හාරමින් සිටි වළ ළඟට ගොස් පරීක්ෂා කළ බැලූවහ.

''දෙවියනේ! මෙන්න රන් කාසි.''රෝසි විමතියෙන් පැවසුවාය.

''ඔව් අපි මේ කාසි වලට කිසිම හානියක් කරන්න හොඳ නැහැ මොකද මේවා අපිට අයිති දේවල් නෙමෙයි.'' ජෙසී පැවසුවාය.

මිතුරියන් විසින් එම කාසිවලට කිසිදු හානියක් නොකර එම කාසි එම ස්ථානයේම තැබූහ.
ඉන්පසු නිවුන් සොහොයුරියන්ගේ භූත වස්ත්‍රාභරණ ඉවත් කර ගැනීමට රෝසි සහ ජෙසී ඔවුන්ට උදව් කළහ.

කලන්තය දැමූ සොරාට ද දැන් සිහිය පැමිණ ඇත. සිව් මිතුරියන් විසින් පිටතින් අගුලු දමන ලද කාමරයේ දොරට වේගයෙන් පහර දෙමින් ඔහු කෑගැසුවේය.

''අනෙකුත් සොරු දෙදෙනාත් ඔවුන් සිර කර ඇති කාමරයේ දොරට මෙන්ම බිත්ති වලටත් පහරදුන්හ. එහෙත් එම සොරුන්ට එම කාමරවලින් එළියට ඒමට හැකියාවක් නැත. මොකද, මෙම සොරුන් සිටින්නේ මාලිගාවක කාමර තුළ ය. එම කාමර ඉතා ශක්තිමත්ය.

# ජයග්‍රහණයක්

සිව් මිතුරියෝ මාලිගාව තුලත් අවටත් හොඳින් පරික්ෂා කළහ. ඔවුහු මාලිගාවේ ඇතුළුවන හා පිටවන දොරටුව සොයා ගෙන නැවතත් සොරුන් සිටින කාමර අසළට පැමිණියහ.

"දැන් වෙලාව හවස 4:30 යි." ජෙසී අතේ බැඳ සිටි අත් ඔරලෝසුව දෙස බලා කීවා ය.

"දැන්නම් ගොඩක් හවස් වෙලා. දැන් අපේ දෙමව්පියෝ අපිව හොයනවත් ඇති අපි එයාලට කියලා නෙවෙයි නේ ආවේ. වයිට්, බ්ලැක් ඔය දෙන්න ගිහින් අපේ දෙමව්පියන්ට මේ මාලිගාවට එන්න කියන්න."රෝසි පැවසුවාය.

"හරි අපි ඉක්මනට ගිහින් එන්නම්." බ්ලැක් සහ වයිට් එකවරම පැවසූහ.

නිවුන් සොයුරියෝ දෙදෙනා ඉක්මනින් මාළිගාවෙන් පිටත් වූහ. ඔවුන් කැලේ ටික දුරක් යන විට ඔවුන්ගේ දෙමාපියන් ඔවුන් සොයාගෙන කැලේ මද දුරක් පැමිණ තිබිණි. එහෙයින් නිවුන් සහෝදරියන් දෙදෙනා තමන්ගේ හා තම මිතුරියන්ගේ දෙමව්පියන් සමග නැවතත් මාලිගාවට පැමිණියහ.

ඔවුන් පැමිණෙන විට රෝසි සහ ජෙසී ෆෙදර් සමග මාලිගාව තුළ සෙල්ලම් කරමින් සිටියහ මෙතරම් සවස් වුණත් මාලිගාව තුළ ඇති එළිය නම් අඩු නොවීය.එයට හේතුව වූයේ බාහිර පරිසරයේ ඇති එළිය පරාවර්තනය වී මාලිගාව තුළට පැමිණීමේ ක්‍රමවේදයක් එම මාලිගාව නිර්මාණය කිරීමේ දී සාදා තිබීම බව සිව් මිතුරියන් මාලිගාව පරීක්ෂා කිරීමේදී සොයා ගත්හ

බිලැක්ට සහ වයිට්ට අතරමඟදී දෙමව්පියන් හමු වුන නිසා ඔවුන්ට විනාඩි 15කටත් අඩු කාලයකින් නැවත මාලිගාවට පැමිණීමට හැකිවිය.

දෙමව්පියන් මාලිගාවට පැමිණි පසු මිතුරියන් විසින් ඔවුන්ට මිතුරියෝ සිදුකළ මේ මාලිගාවේ වික්‍රමය පිළිබඳ ව දිගු විස්තරයක් කළ හ.

ඔවුන්ගේ දෙමව්පියෝ ද මෙම මිතුරියන් මේ වික්‍රමය අගය කළහ.

දෙමව්පියෝ කටයුතු කර මේ සොරුන් පොලිසියට භාර දුන්හ. මාලිගාවේ තිබූ කහවණුද ඔවුහු පොලිසියට භාර දුන්හ.

ඉන් පසු සිව් මිතුරියන්ද ෆෙදර් කුරුල්ලා ද මිතුරියන්ගේ දෙමව්පියෝ ද සතුටින් නිවෙස් කරා පැමිණියහ.

ඊළඟ දිනයේ දී මෙම මිතුරියෝ ගමේ විශාලම සම්පතක් වූ මේ පැරණි මාලිගය ආරක්ෂා කර ගමට කළ සේවය වෙනුවෙන් ඔවුන්ගේ ගමෙන් විශාල උත්සවයක් සංවිධානය කර තිබිණි. එහිදී මෙම මිතුරියන් හතර දෙනාගේ කණ්ඩායම සිව් මිතුරියෝ ලෙස නම් කෙරුණි.

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුලින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20